**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2024**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ("NOCSL") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS for SMEs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට(SLFRS for SMEs), අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කමිටුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කමිටුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කමිටුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කම්ටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි කම්ටුවේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කම්ටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කම්ටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කම්ටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කමිටුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කමිටුව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව කමිටුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය තුලදී නීති කටයුතු සඳහා වැය වූ මුදල රු.11,091,325ක් විය. කෙසේ වෙතත් සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ජේද 21.15 සහ 21.16 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල අදාළ නීති කෘත්‍යයන් පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේ දී මේ සම්බන්ධව විශේෂ සටහනක් යොදන අතර එම සටහන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරන්නෙමු. | සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පිළිපැදිය යුතුය. |
| (ආ) ජාතික ඔලිම්පික් කමිටුව යටතේ ලියාපදිංචි වී ඇති සාමාජික ක්‍රීඩා සංගම් සහ සම්මේලන වෙත රු.42,560,616 ක් ගෙවා ඇති බව විගණන නියැදි පරික්ෂාවේ දී හෙළිදරව් විය. කෙසේ වෙතත්, සුළු හා මධ්‍ය පරිමාණ **අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි** (SLFRS for SMEs) 33.9 ජේදයේ දක්වා ඇති පරිදි, අදාළ පාර්ශවයන් අතර සිදුවූ ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ යුතු අනිවාර්ය හෙළිදරව්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ක්‍රීඩා සංගම් සහ සම්මේලන වෙත කරන ලද ගෙවීම් අදාළ පාර්ශව ගනුදෙනු ලෙස විශේෂයෙන් සඳහන් කර නොමැත.ඒ සඳහා විශේෂ සටහනක් යෙදිය හැක . | සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පිළිපැදිය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සහ 2021 වර්ෂවලදී මිලදී ගත් රු.1,476,600 ක් වටිනා දේපළ, පිරියත සහ උපකරණ (PPE) සමාලෝචනයට භාජනය වන වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. තවද, මෙම වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වත්කම් සත්‍යාපනයක් සිදු කර නොමැත. | ව්‍යාපෘති යටතේ (ස්ථාවර වත්කම්ද ඇතුලත්ව ) භාණ්ඩ මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල අදාල ව්‍යාපෘති ගිණුම වෙත බැර කර ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් නොවූ සියලුම දේපල පිරියත සහ උපකරණ හඳුනා ගැනීමට, තහවුරු කර ගැනීමට සහ පිළිගැනීම සඳහා කමිටුව විසින් වහාම පියවර ගත යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශනයට අනුව<br>රු. | අනුරූපී වාර්තා අනුව<br>රු. | වෙනස<br>රු . | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ගෙවියයුතු මුදල් | 23,760,635 | 31,008,914 | 7,248,279 | වෙනස්කම් පිළිබඳ පැහැදිලි කිරීම් සපයා නොමැත | ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 1.6 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

### 1.6.1 ලැබියයුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට රු.25,009,172 ක් වූ මුළු ලැබිය යුතු මුදල් වලින් රු.5,118,746 ක් මෙම වාර්තාවේ දිනය දක්වා අයකර නොතිබුණි. තවද, මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ඵලදායී අයකර ගැනීමේ පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු හිඟ ශේෂයන් පිළිබඳ විස්තර කෙරෙන ලේඛන සපයා නොමැත. | තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව හිඟ ශේෂයන් කමිටුව විසින් අයකර ගතයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **2019** අංක **24** දරන ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත | විදේශීය තරගවලට සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජාතික ඔලිම්පික් කමිටුව වාර්තා පවත්වාගෙනගොස් නොතිබුණි. තවද, එවැනි ක්‍රියාකාරකම්වලට එරෙහිව ජාතික ඔලිම්පික් කමිටුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | ඔබ විසින් ඉල්ලා සිටිනු ලබන වාර්තාවට සමාන ආකාරයේ වාර්තාවක් ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වන්නෙමු . | ක්‍රීඩා නීතිරීතිවලට අනුකූල වියයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.44,942,548 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,813,606 ක් විය. ඒ අනුව රු.56,756,154 ක දැඩි පිරිහීමක් මූල්‍ය ප්‍රතිඵලයෙහි නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වූයේ පෙර වසරට සාපේක්ෂව මුළු ආදායම රු.83,013,052 කින් අඩු වීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් පහත දැක්වේ.

| විස්තරය | 2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය | 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය | වෙනස්කම් සතුටුදායක / (අහිතකර ) | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| <u>ආදායම</u> | | | | |
| IOC, OCA සහ අනෙක් ආයතන වෙතින් ලැබුණු සහනාධාර | 58,973,650 | 77,273,996 | (18,300,346) | 23.68 |
| පොළී ආදායම | 14,497,825 | 20,500,384 | (6,002,559) | 29.28 |
| කුලී ආදායම | 9,272,975 | 14,874,550 | (5,601,575) | 37.66 |
| ව්‍යාපෘති ආදායම | 93,553,161 | 145,546,350 | (51,993,189) | 35.72 |
| අනෙකුත් ආදායම් | 5,052,707 | 6,168,090 | (1,115,383) | 18 |

| | | | | |
|---|---|---|---|---|
| **<u>වියදම්</u>** | | | | |
| ක්‍රියාකාරකම් සඳහා වියදම් | 109,814,569 | 160,077,891 | 50,263,322 | 31.39 |
| පරිපාලන වියදම් | 51,835,915 | 47,204,980 | (4,630,935) | 9.81 |
| නීති ගාස්තු | 11,091,325 | - | (11,091,325) | 100 |
| අනෙකුත් වියදම් | 53,551,057 | 45,266,893 | (8,284,164) | 18.30 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ..

බාහිර මූල්‍යකරණ සහයෝගය අඩුවීම මත හෝ මූල්‍ය ආධාර ලැබීමේ ප්‍රමාදය මත ජාත්‍යන්තර ආයතනවලින් ලැබුණු සහනාධාර රුපියල් මිලියන 18.3 කින් හෙවත් 23.68% කින් අඩු වී තිබුණි.තවද ව්‍යාපෘති ආදායම රුපියල් මිලියන 51.99 කින් හෙවත් 35.72% ක ප්‍රමාණාත්මක අගයකින් අඩුවීම හේතුවෙන් ව්‍යාපෘතිවල පරිමාණය, අඛණ්ඩතාව හෝ අරමුදල් සැපයීම පිළිබඳව  ගැටළු උද්ගතවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ ) | 2022 නොවැම්බර් 01 වන දින කමිටුව පෞද්ගලික සමාගමක් සමඟ බදු ගිවිසුමකට එළඹුණේ මාසිකව රු.750,000 ක කුලියකට වසර දෙකක කාලයක් සඳහා තම අවන්හල් පරිශ්‍රය බදු දීම සඳහා වන අතර, බදුකරුගෙන් අත්තිකාරම් මුදලක් ලබා නොගෙන රු.9,051,979 ක බදු කුලී මෙම වාර්තාවේ දිනය දක්වා අයකරගෙන නොතිබුණි. තවද, අවන්හල 2023 අප්‍රේල් මාසයේ සිට වසා දමා තිබූ අතර ඉන් පසුව එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. හිඟ කුලී අයකර ගැනීමට සහ දේපළ ඵලදායී ලෙස භාවිතා කිරීමට අපොහොසත් වීම කළමනාකරණයේ දුර්වලතා පෙන්නුම් කරයි. | අදහස් දැක්වීම් ලැබී නොමැත. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට සහ දේපළ ඵලදායී ලෙස භාවිතා කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ආ ) | අදාළ නියාමන සහ පාලන රාමුවට අනුකූලව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික ක්‍රීඩා සම්මේලන හෝ සංගම් ලෙස ලියාපදිංචි කර නොතිබූ ක්‍රීඩා සංවිධාන දෙකක් (02) ජාතික ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබ ඇත. | මෙම සංගම්වලට වාර්ෂික මහා සභා රැස්වීමට සහ නිරීක්ෂණ මට්ටමින් පැවැත්වෙන විශේෂ රැස්වීම්වලට සහභාගී විය හැකි අතර කිසිදු අවස්ථාවක ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතියක් නොමැත. | පාලන රාමුව සමඟ අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විධායක කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගේ අවසරය සහ සහතිකය ලබා නොගෙන, භාණ්ඩාගාරිකගේ අවසරය සහ සහතිකය මත පමණක් විවිධ ක්‍රියාකාරකම් සඳහා රු.19,964,733 ක මුළු ගෙවීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, මෙම ගෙවීම් අනවසර ගනුදෙනු ලෙස නිරීක්ෂණය විය. | දෙවන අනුමැතියක් අවශ්‍ය නොවන බැවින්, භාණ්ඩාගාරික යනු සංවිධානයේ මූල්‍ය කටයුතු භාරව සිටින ඉහළම නිලධාරියා වේ. | අනුමත කරන ලද මූල්‍ය පටිපාටි පිළිපැදිය යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024 ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ජාත්‍යන්තර තරඟ 07 ක්, ජාතික තරඟ 14 ක් සහ දේශීය ක්‍රියාකාරකම් 13 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ජාත්‍යන්තර තරඟ 05 ක්, ජාතික තරඟ 02 ක් සහ දේශීය ක්‍රියාකාරකම් 11 ක් සැලසුම් කළ පරිදි පවත්වා නොතිබුණි. ඊට අමතරව, ක්‍රීඩා දින දර්ශනයට ඇතුළත් නොවූ ජාත්‍යන්තර තරඟ 01 ක්, ජාතික තරඟ 03 ක් සහ දේශීය ක්‍රියාකාරකම් 05 ක් සඳහා ජාතික ඔලිම්පික් කමිටුව සහභාගී වී තිබුණි. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නිකුත් කරන වාර්ෂික ක්‍රීඩා දින දර්ශනය ජාතික ඔලිම්පික් කමිටුව විසින් ක්‍රියාත්මක නොකෙරේ.. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නිකුත් කරන වාර්ෂික ක්‍රීඩා දින දර්ශනය අනුගමනය කල යුතුය. |
| (ආ) | රු.9,197,892 ක මුළු ශේෂයක් සහිත බැංකු ගිණුම් පහක් (05) වසර පහකට වැඩි කාලයක් අක්‍රියව පැවතුනි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය දක්වා අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා මෙම ගිණුම් සක්‍රිය කිරීමට හෝ මෙම ගිණුම් වසා දැමීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ ව්‍යාපෘතියේ මෙහෙයුම් තත්ත්වය පරීක්ෂා කිරීමෙන් පසු අනාගතයේදී එම ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ. | බැංකු ශේෂය ඵලදායි ලෙස උපයෝජනය කලයුතුය. |